**ශීර්ෂය 273 – පුත්තලම දිස්ත්‍රික් ලේකම් කාර්යාලය**

-----------------------------------------------------

**1. මූල්‍ය ප්‍රකාශන**

------------------

**1.1 තත්ත්වාගණනය කළ මතය**

------------------------------

පුත්තලම දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ 2019 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් සමන්විත 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශය 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව පුත්තලම දිස්ත්‍රික් ලේකම් කර්යාලයේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් ඇතුළත් සම්පිණ්ඩන වාර්තාව 2020 මැයි 28 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට අදාළ වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2020 සැප්තැම්බර් 18 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව මෙම වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, 2019 දෙසැම්බර් 03 දිනැති අංක 271/2019 දරන රාජ්‍ය ගිණුම් චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව පිළියෙල කළ එම මූල්‍ය ප්‍රකාශනවලින් 2019 දෙසැම්බර් 31 දිනට දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මුලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**

---------------------------------------------

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන වගන්තියේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම**

----------------------------------------------------------------------------------------------------------

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මුලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර, එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

---

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකාධිපති සම්පිණ්ඩන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන්ගෙන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන් ඇති විය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි බලපෑමක් විය හැකි බවට අපේක්ෂා කෙරේ.

මා විසින් වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සකසා ගැනීමේ දි වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදි. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබලවන්නේ දූස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මගහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මග හැරීමෙන් වංචාවක් ඇතිවීමට හේතු වන බැවිනි.

- දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදි.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදි.
- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදි.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දූර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ගණන්දීමේ නිලධාරී දැනුවත් කරන ලදී.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

---

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඈ) වගන්තිය හා 38 වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමග අනුරූප වේ.

(ආ) මෙම වාර්තාවේ ඡේදයන්හි ඇතුළත් 1.6.2 ඡේදයේ නිරීක්ෂණ සම්බන්ධයෙන් ඉකුත් වර්ෂයේ මා විසින් ඉදිරිපත් කරන ලද නිර්දේශ සමාලෝචිත වර්ෂයේ දී ක්‍රියාත්මක කර නොතිබුණි.

**1.6 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම**

**1.6.1 මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය**

පහත සඳහන් කරුණු නිරීක්ෂණය විය.

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | මාදම්පේ ප්‍රාදේශීය ලේකම් කාර්යාලය යටතේ පවතින නිල නිවාසය පිහිටි ඉඩමේ වටිනාකම රු.3,650,000 ක්, ඉඩම් යටතේ ගිණුම්ගත කර තිබිය දී, එම වටිනාකම නැවත ගොඩනැඟිලි සහ ඉදිකිරීම් යටතේ මූල්‍ය නොවන වත්කම් ප්‍රකාශයට ඇතුළත් කර තිබුණි. | නිවැරදිව වත්කම් ගිණුම්ගත කළයුතු වීම. | ගොඩනැඟිලි සහිත ඉඩම් ගොඩනැඟිලි සහ ඉදිකිරීම් යටතේ ගිණුම් කරන ලෙස රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුව විසින් ලබාදුන් උපදෙස් යටතේ කටයුතු කිරීමේ දී ඉඩම් යටතේ සටහන් කල වටිනාකම ඉවත් කිරීමට අතපසු වී ඇත. 2020 වර්ෂයේ දී එය නිවැරදි කිරීමට කටයුතු කරන බව දන්වමි. |
| (ආ) | මාදම්පේ ප්‍රාදේශීය ලේකම් කාර්යාලය යටතේ පවතින වලහහේන සේවා පියස පිහිටි ඉඩමේ වටිනාකම සහ මාදම්පේ ප්‍රාදේශීය ලේකම් කාර්යාලය පිහිටි ඉඩමේ වටිනාකම පිලිවෙලින් රු.2,150,000 ක් සහ රු.16,000,000ක් ලෙස එකතුව රු.18,150,000 ක් මූල්‍ය නොවන වත්කම් ප්‍රකාශයේ ''ඉඩම්'' යටතේ ගිණුම්ගත කර තිබිය දී එම වටිනාකම මූල්‍ය නොවන වත්කම් ප්‍රකාශයේ ගොඩනැඟිලි සහ ඉදිකිරීම් යටතේ ද දක්වා තිබුණි. | -එම- | -එම- |
| (ඇ) | ජාතික ආපදා සහන සේවා මධ්‍යස්ථානය, ස්වදේශ කටයුතු අමාත්‍යාංශය සහ ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය මඟින් නියඟයෙන් පීඩාවට පත් ජනතාවට පානීය ජලය බෙදාහැරීම සඳහා ලබාදෙන ලද ට්‍රැක්ටර්, බවුසර් සහ ලොරි බවුසර් පිළිවෙලින් 25ක්, 09ක් සහ 08ක් ලෙස එකතුව රථ 42ක් ලබාදී තිබූ අතර, එම බවුසර් දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට පවරාගෙන ගිණුම්ගත කිරීමට කටයුතු කර නොතිබුණි. | අදාල වාහන පවරාගෙන ගිණුම් ගතකල යුතු වීම. | පුත්තලම් දිස්ත්‍රික් ලේකම් කාර්යාලය වෙත පවරාගෙන ඇති වාහන සියල්ල 2020 වර්ෂය වන විට ගිණුම්ගත කිරීමට කටයුතු කරන අතර, ආපදා කළමනාකරණ අමාත්‍යාංශය විසින් ලබාදුන් වාහන මෙතෙක් පවරා නොමැති බැවින්, ගිණුම්ගත කල නොහැකි බව දන්වමි. |

| | | | |
|---|---|---|---|
| (ඇ) | ප්‍රාදේශීය ලේකම් කාර්යාල තුනක ග්‍රාම නිලධාරී කාර්යාල පවත්වාගෙන යනු ලබන රජයේ ඉඩම් හා ගොඩනැගිලි තක්සේරු කර ගිණුම්ගත කර නොතිබුණි. | දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට හා ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට අයත් සියලු වත්කම් ගිණුම්ගත කළයුතු වීම. | තක්සේරුව සිදුකර නොමැති හෙයින් එම වටිනාකම ගිණුම්ගත කිරීමට නොහැකිව ඇත. |

**1.6.2 ලේඛන හා පොත්පත් පවත්වා නොතිබීම**

දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් පහත දැක්වෙන ඇතැම් ලේඛන පවත්වා නොතිබුණු අතර, ඇතැම් ලේඛන විධිමත්ව හා යාවත්කාලීනව පවත්වා නොතිබුණු බව නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය විය.

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | **බැරකම් පිළිබඳ ලේඛනය** | | |
| | මුදල් රෙගුලාසි 214 ප්‍රකාරව බැරකම් පිළිබඳ ලේඛනයක් යාවත්කාලීනව පවත්වා නොතිබුණි. | මුදල් රෙගුලාසි 214 ප්‍රකාරව බැරකම් ලේඛනයක් යාවත්කාලීනව පවත්වාගෙන යා යුතු වීම. | පවත්වාගෙන යමි |
| (ආ) | **වාහන ලොග් පොත** | | |
| | මුදල් රෙගුලාසි 1645(අ) ප්‍රකාර වාහන ලොග් පොත් යාවත්කාලීනව පවත්වා නොතිබුණි. | මුදල් රෙගුලාසි 1645(අ) ප්‍රකාර වාහන ලොග් පොත් යාවත්කාලීනව පවත්වා ගෙන යායුතු වීම. | පවත්වාගෙන යමි. |

**1.6.3 නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම**

නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය වූ නීති, රීති හා රෙගුලාසිවල විධිවිධානවලට අනුකූල නොවූ අවස්ථා පහත විග්‍රහ කර දැක්වේ.

| නීති,රීති හා රෙගුලාසි වලට යොමුව | නිරීක්ෂණය<br>අනුකූල නොවීම | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) **රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ** | | | |
| 2017 අප්‍රේල් 19 දිනැති 03/2017 දිනැති චක්‍රලේඛය | කරුවලගස්වැව ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ නිලධාරීන් 89 දෙනා 2019 වර්ෂයේ දී ඇඟිලි සළකුණු යන්ත්‍රයේ පැමිණීම හා පිටවීම සටහන් කර නොතිබුණි. | චක්‍රලේඛ ප්‍රකාරව කටයුතු කළ යුතු වීම. | ප්‍රතිපාදන මුදල් නොලැබීම මත අක්‍රියව තිබූ ඇඟිලි සළකුණු යන්ත්‍රය යථාවත් කිරීමට ප්‍රමාද වී ඇත. ප්‍රතිපාදන ලද පසු ඇඟිලි සලකුණු යන්ත්රය අවශ්‍යතාව සම්පූර්ණ කිරීමට කටයුතු කරනු ලැබේ. |
| **(ආ) රාජ්‍ය මුදල් චක්‍රලේඛ** | | | |
| (i) 2015 ජුනි 14 දිනැති අංක 30/2015 දරන චක්‍රලේඛය | කාර්ය නිම කර දින 10ක් ඇතුළත ලබාගත් තත්කාර්ය අතුරු අග්‍රිමය නිරවුල් කළයුතු වුවත්, ප්‍රාදේශීය ලේකම් කාර්යාල තුනක අවස්ථා 23 ක දී එකතුව රු.817,920 ක මුදලක් සම්බන්ධයෙන් එසේ කටයුතු කර නොතිබුණි | 30/2015 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය ප්‍රකාරව කටයුතු කළ යුතු වීම. | අතුරු අග්‍රිම ලේඛනය යාවත්කාලීන කිරීමේ කටයුතු නොකිරීම නිසා මෙම අඩුපාඩුව ඇති වී තිබෙන බව දැනුම් දෙමි. නැවත එවැනි අඩුපාඩු ඇති වීම වළක්වා ගැනීමට කටයුතු කරමි. |

| | | | | |
|---|---|---|---|---|
| (ii) | 2012 ජනවාරි 05 දිනැති අංක 2012/01 දරන චක්‍රලේඛය | ආණමඩුව ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් ප්‍රජාපාදක සංවිධාන වෙත පිරිනමන ලද කොන්ත්‍රාත් 09 ක් උපකොන්ත්‍රාත්කරුවන්ට පවරා තිබුණි. | චක්‍රලේඛය ප්‍රකාරව කටයුතු කළ යුතු බව හා උපකොන්ත්‍රාත් ලබාදී ඇති ප්‍රජා සංවිධාන ආසාධු ගත කළ යුතු වීම. | ස්වේච්ඡා සංවිධාන සමඟ කොන්ත්‍රාත් ගිවිසුම් අත්සන් කිරීමේ දී උප කොන්ත්‍රාත් ලබා නොදිය යුතු බවට එකඟව ගිවිසුම් ගත වන අතර, එසේ උප කොන්ත්‍රාත් ලබාදීම ප්‍රාදේශීය ලේකම්වරු දැනුවත්ව සිදු වන කටයුත්තක් නොවන හෙයින් එය පාලනය කිරීම අසීරු බව දන්වමි. |

**2. මූල්‍ය සමාලෝචනය**

----------------------

**2.1 වියදම් කළමනාකරණය**

--------------------------

පහත සඳහන් කරුණු නිරීක්ෂණය විය.

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| | ---------------------- | ----------- | --------------------------------- |
| (අ) | 2019 දෙසැම්බර් 03 දින අංක 271/2019 රාජ්‍ය ගිණුම් චක්‍රලේඛයේ 3.5 ඡේදයේ උපදෙස්වලට අනුකූලව වැය විෂයයන් 11 ක ඉතිරිය වූ රු.31,089,741 ක් සම්බන්ධයෙන් ACA 2(ii) ආකෘතියේ පිළිගත හැකි හේතු ඉදිරිපත් කර නොතිබුණි. | වියදම් පිළිබඳ නිවැරදි පුරෝකථනයක් කර වාර්ෂික ඇස්තමේන්තු පිළියෙල කළයුතු වීම. | විගණන විමසුමට එකඟ වී ඇත. |
| (ආ) | 2019 දෙසැම්බර් 03 දින අංක 271/2019 රාජ්‍ය ගිණුම් චක්‍රලේඛයේ 06 වන වගන්තියේ උපදෙස්වලට අනුකූලව මූලික සහ සංශෝධන වියදම් ඇස්තමේන්තු විචලතාව පැහැදිලි කිරීම සඳහා ACA 2(iii) ආකෘති පත්‍රය සම්පූර්ණ කළයුතු වුවත්, අදාල විචලතාව රු.18,650,800 ක් වූ වැය විෂයයන් 07ක් සම්බන්ධයෙන් පිළිගත හැකි හේතු ඉදිරිපත් කර නොතිබුණි. | -එම- | එකඟ වේ. |

## 2.2 බැරකම් හා බැඳීම්වලට එළඹීම

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| 2019 වර්ෂයේ ගිණුමේ සටහන් (iii) යටතේ අනාවරණය කර තිබූ වැය විෂයයන් 08ක බැරකම රු.1,466,798ක් වූ අතර, එදිනට භාණ්ඩාගාරික මුද්‍රිත 192 අනුව බැරකම රු.1,436,609ක් වූයෙන් වෙනස රු.30,188ක් විය. එම වෙනසට හේතු පැහැදිලි කර නොතිබුණි. | වෙනස්කම් හඳුනාගෙන නිවැරදි කිරීමට කටයුතු කළයුතු වීම. | බැරකම් සටහන් (iii) යටතේ අනාවරණය කරන ලද බැරකම් වටිනාකම සත්‍ය වශයෙන් ම කාර්යාලය සතුව පැවති බැරකම් ප්‍රමාණය බව කාරුණිකව දන්වමි. සිගාස් ගිණුම් පද්ධතියේ ඇතුළත් බැරකම් පිළිබඳව දත්ත ගොනුව උඩුගත කිරීමේ දී සිදුවූ යම් අඩුපාඩුවක් මත මෙම වෙනස සිදුව ඇත. ඉදිරි වසරවල මෙවන් වෙනසක් පැවතුණ හොත් වෙනසට හේතු පැහැදිලි කිරීමට සටහන් කර ගතිමි. |

## 2.3 අත්තිකාරම් නිකුත් කිරීම හා පියවීම

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | ප්‍රාදේශීය ලේකම් කාර්යාල තුනක වැඩ තහනම් කර වසර 02 - 13 ක් අතර, කාලයක් ගත වී තිබූ නිලධාරීන් තිදෙනෙකුගේ රු.202,988ක ණය ශේෂ 2019 දෙසැම්බර් 31 වනවිටත්, අයවී නොතිබුණි. | අදාල හිඟ මුදල් අයකර ගැනීමට කටයුතු කළයුතු වීම. | විගණන විමසුම පිළිගනිමි. |
| (ආ) | ප්‍රාදේශීය ලේකම් කාර්යාල තුනක මියගිය හා විශ්‍රාම ගිය නිලධාරීන් තුන්දෙනෙකුගේ රු.381,629 ක ණය ශේෂ අත්තිකාරම් ගිණුම් ශේෂ ලෙස පෙන්වා තිබූ අතර, ඒවා 2019 දෙසැම්බර් 31 දින වනවිටත්, අයවී නොතිබුණි. | අදාල හිඟ මුදල් අයකර ගැනීමට කටයුතු කළයුතු වීම. | විගණන විමසුම පිළිගනිමි. |

| | | | |
|---|---|---|---|
| (ඇ) | අංක 30/2008 දරන හා 2008 දෙසැම්බර් 31 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයෙන් බැහැරව රු.250,000ක සීමාව ඉක්මවා ආරච්චිකට්ටුව ප්‍රාදේශීය ලේකම් කාර්යාලය ණය ලබාදුන් අවස්ථාවක් නිරීක්ෂණය විය. | රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ ප්‍රකාරව කටයුතු කළයුතු වීම. | විගණන විමසුම පිළිගනිමි. |

**2.4 තැන්පතු ශේෂයන්**

| **විගණන නිරීක්ෂණය** | **නිර්දේශය** | **ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම** |
|---|---|---|
| වර්ෂ 02 ඉක්ම වූ කල් ඉකුත් වූ තැන්පතු ගිණුම් ශේෂ පහක තිබූ රු.58,118,110ක් වටිනාකම සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි 571 ප්‍රකාර කටයුතු කර නොතිබුණි. | මුදල් රෙගුලාසි 571 ප්‍රකාරව ආදායමට ගැනීමට කටයුතු කළ යුතු වීම. | පිළිගනිමි. |

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 අපේක්ෂිත නිමවුම් මට්ටම ලබා නොගැනීම

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | **විගණන නිරීක්ෂණය** | **නිර්දේශය** | **ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම** |
|---|---|---|---|
| (අ) | නාත්තන්ඩිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ 2019 ගම්පෙරලිය වැඩසටහන යටතේ දුන්කන්නාව මහගෙදරවත්ත මාර්ගයට තාර දැමීම සඳහා රු.481,144ක මුදලක් කොන්ත්‍රාත්කරුට ගෙවීමට නියමිතව තිබූ නමුත්, ප්‍රධාන මාර්ගයට සම්බන්ධ වන කොටස තාර නොදමා අතහැර තිබීම, මාර්ගය දෙපස කාණු පද්ධතිය සැලසුම් කර නොතිබීම හා ඇස්තමේන්තු ප්‍රකාරව මාර්ගයේ පළල මීටර් 3ක් නොමැති අවස්ථාවීම වැනි කරුණු නිරීක්ෂණය විය. | ඇස්තමේන්තු ප්‍රකාරව ව්‍යාපෘති ක්‍රියාත්මක කළයුතු වීම. | තාක්ෂණ නිලධාරි විසින් නැවත පරීක්ෂා කර ලබා දෙන ලද වාර්තාවට අනුව විගණනය විසින් පෙන්වා දී ඇති පරිදි සමහර තැන්වල මීටර් 3ට අඩු මට්ටමක පවතින බව පිළිගන්නා අතර තාක්ෂණ නිලධාරිගේ මිනුම් වාර්තාවට අනුව අදාල අයිතමය අවම පළල සඳහා නැවත ගණනය කිරීම සිදු කර වැඩිපුර ගෙවා ඇති රු. 20,935 ක මුදල ව්‍යාපෘතියේ රැඳවුම් මුදලින් අය කර රාජ්‍ය ආදායමට අධිභාර කිරීමට කටයුතු කරන ලදී. ඊට අදාළ ගෙවීම් පත්‍රයේ පිටපතක් ඇමුණුම 02 ලෙස මේ සමඟ |

| | | | |
|---|---|---|---|
| | | | ඉදිරිපත් කර ඇත. මේ පිළිබඳව අදාල නිලධාරීන්ගෙන් නිදහසට කරුණු විමසීමක් සිදුකර අවශ්‍ය පියවර ගැනීමට කටයුතු කරන බව වැඩිදුරටත් දන්වා සිටිමි. |
| (ආ) | ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ 03 ක රු.7,126,540 ක් දරා මාර්ග 11 ක් සංවර්ධනය කිරීමේ දී කාණු පද්ධතිය හා අවශ්‍ය ස්ථානවලට බෝක්කු සකස් කිරීමකින් තොරව මාර්ග තලය පමණක් වැඩිදියුණු කර තිබීම නිසා වැසි ජලය ගලා යාමට ක්‍රමයක් නොමැති වීමෙන් වැයකළ මුදලින් අපේක්ෂිත ප්‍රතිඵල ලැබී නොතිබුණි. ඇතැම් අවස්ථාවල වැඩිදියුණු කල මාර්ග තලය හරහට කාණු කපා වැසි ජලය බැස්සවීමට සිදුවී තිබුණි. | හැකි සෑම විටම මුළු පිරිවැය ඇස්තමේන්තුවක් මත ප්‍රතිපාදන සලසා නිවැරදි සැලසුම් මත ඉදිකිරීම් කලයුතු වීම.. | මෙම යෝජනා ගම්වාසීන් සහ ප්‍රාදේශීය දේශපාලන නියෝජිතයින් විසින් සිදු කරන ලද අතර ලබා දී තිබූ ප්‍රතිපාදන උපරිම උපයෝජනයෙන් යුක්තව මෙම ව්‍යාපෘතියේ සැලකිය යුතු වැඩ ප්‍රමාණයක් අවසන් වූ අතර මේ වන විට මෙම ගොඩනැගිල්ල භාවිතා කල හැකි මට්ටමේ පවතී. ඉදිරියේ දී ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේ දී අදාල උපදෙස් පරිදි කටයුතු කිරීමට එකග වෙමි. |
| (ඇ) | ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ 02 ක රු.11,419,751 ක් දරා ගොඩනැඟිලි 05 ක් ඉදිකිරීමේ දී මුළු පිරිවැය ඇස්තමේන්තු සකසා අවශ්‍ය ප්‍රතිපාදන ලබාගෙන ඉදිකිරීම් නොකිරීම නිසා අදාල ඉදිකිරීම් ප්‍රයෝජනයකට ගතහැකි මට්ටමට නිමකර නොතිබුණි. | - එම - | මෙය කොටසක් ඉදිකර තිබූ ගොඩනැගිල්ලකි. එබැවින් ගම්වාසීන් සහ දේශපාලන නියෝජිතයන්ගේ ඉල්ලීම පරිදි මෙම ව්‍යාපෘතිය භාවිතා කල හැකි මට්ටමට ගත හැකි පරිදි ඉදිකිරීම සඳහා ප්‍රතිපාදන වෙන් කිරීමට කටයුතු යොදා ඇත. ලබා දී තිබූ ප්‍රතිපාදන උපරිම උපයෝජනයෙන් මෙම ව්‍යාපෘතියේ කටයුතු සිදු කිරීමට කටයුතු කරන ලද අතර මේ වන විට මෙම විහාරස්ථානයේ දායකත්වයෙන් බොහෝ ප්‍රමාණයක් වැඩ කටයුතු අවසන් කර ඇත. ඉදිරියේදි ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේ දී අදාළ නිරීක්ෂණ අනුව කටයුතු කිරීමට එකඟ වෙමි. |

| | | | |
|---|---|---|---|
| (ඇ) | 2019 ගම්පෙරළිය වැඩසටහන යටතේ මහවැව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ කුඩාවැවෙන් ජලජ ශාක ඉවත් කිරීම සඳහා රු.1,923,000ක කලවැඩ වටිනාකමකට මුදල් ගෙවා තිබූ මුත්, 2020 ජනවාරි 04 දින විගණන පරීක්ෂාවට අනුව වැවෙහි විශාල ප්‍රදේශයක සැල්වීනියා වැසී ජලජ ශාක වර්ධනය වී තිබීමෙන් දරන ලද වියදම නිශ්කාර්ය වී තිබුණි. | ව්‍යාපෘති සඳහා රජයේ මුදල් වැය කිරීමේ දී උපරිම ඵලදාවක් ජනතාවට ලැබෙන පරිදි කටයුතු කළයුතු වීම. | විශාලත්වය අක්කර 47 ක් වන අතර අදාල ඇස්තමේන්තුව අනුව අක්කර 17 ක ජලජ ශාක ඉවත් කිරීම සිදු කළ යුතු වුවත් අක්කර 20 ක ජලජ ශාක ඉවත් කර ඇත. |
| (ඉ) | මාදම්පේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ ගල්මුරුව දකුණ පානීය ජල ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා රු.1,066,099 ක මුදලක් වැයකර තිබූ අතර, නල ළිඳේ ප්‍රමාණවත් ජල ධාරිතාවක් නොමැති වීම නිසා උක්ත ව්‍යාපෘතිය අසාර්ථක ව්‍යාපෘතියක් බවට පත්ව තිබුණි. | -එම- | ජල ධාරිතා පරීක්ෂණයේ වාර්තාව මඟින් එක්වරකට ජල ලීටර් 28,800ක් ලබා ගත හැකි බවත්, වරකට ජලය පොම්ප කිරීමේ කාලය පැය 02ක් ලෙසත් මිනිත්තුවකට ලීටර් 40ක් ගත හැකි බවත් දන්වා ජාතික ජල සම්පත් මණ්ඩලයේ පළාත් කළමණාකරුගේ (වයඹ) අංක PM/NW/PUT/2019-43/81/82/83 හා 2019.12.30 දිනැති ලිපිය මඟින් ළිඳෙහි ධාරිතාව පිළිබඳව වාර්තාවක් මා වෙත යොමු කර ඇත. |
| (ඊ) | නාත්තන්ඩිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ රු.2,768,903 ක් වැයකර ක්‍රීඩා පිටි 03 ක් වැඩිදියුණු කිරීමේ දී වැසි ජලය බැසයාමට ක්‍රමයක් සැලසුම් කර ඉදිකර නොතිබීමෙන් එකී ක්රීඩාපිටි ප්‍රයෝජනයට ගතහැකි මට්ටමට වැඩිදියුණු වී නොතිබුණි. | ව්‍යාපෘතිය ඇගයීමේ දී පූර්ව සියළු සාධක සලකා බලා පවත්නා ගැටළු පිළිබඳව හඳුනාගෙන ඒ අනුව, ක්‍රියාමාර්ග ගතයුතු වීම. | මේ වන විට හොඳින් ඇසිරි ඇති බැවින් වර්ෂා කාලයේ මෙම බොරළු සෝදා නොයනු ඇත .ඉදිරියේදී ලැබෙන ප්‍රතිපාදන මඟින් මෙම ක්‍රීඩා පිට්ටනියේ ජලය බැස යන ලෙස කාණු පද්ධතියක් සකස් කිරීමට අපේක්ෂිත ය. |

## 3.2 අපේක්ෂිත ප්‍රතිලාභ (Outcome) ලබා නොගැනීම

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | වෙන්නප්පුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ දකුණු මිරිස්සන්කොටුව වැව ප්‍රතිසංස්කරණය කිරීම සඳහා යටිතල පහසුකම් සංවර්ධනය කිරීමේ විශේෂ වැඩසටහන යටතේ රු.1,000,000ක ප්‍රතිපාදනය ලබාදී තිබූ අතර, එමඟින් වැවෙහි ජලජ ශාඛ ඉවත් කිරීම සොරොව්ව හා පිටවාන සකස් කිරීම, ඇළ වේලි සකස් කිරීම සඳහා ඇස්තමේන්තු කර තිබූ මුත්, සොරොව්ව අලුත්වැඩියාව හා ඇළවේලි සකස් කිරීම නිසි ආකාරව සිදුකර නොතිබුණි. | ව්‍යාපෘති සඳහා රජයේ මුදල් වැය කිරීමේ දී උපරිම ඵලදාවක් ජනතාවට ලැබෙන පරිදි කටයුතු කළයුතු වීම. | දකුණු මිරිස්සන්කොටුවකුලම වැව සඳහා රු. මිලියනයක ප්‍රතිපාදන ලබා දුන් අතර ඒ සඳහා පුත්තලම සහකාර ගොවි ජන සංවර්ධන කාර්යාලය විසින් ඇස්තමේන්තු පිලියෙල කරනු ලැබූවෙන් 2019/10/02 දින ප්‍රසම්පාදනය සිදු කර ඇත. ඒ වන විට වර්ෂා කාලය බලපා තිබූ බැවින් 2019/12/31 දිනට ප්‍රථම සොරොව්වේ අලුත්වැඩියාව සිදුකිරීමට ද ඇලවේලි නිසි ආකාරව සකස් කිරීමට නොහැකි විය. |
| (ආ) | 2014 වර්ෂයේ ක්‍රියාත්මක කල දැයට කිරුළ වැඩසටහන යටතේ ඉදිකල නවගත්තේගම රංග ශාලාව නිසි පරිදි ප්‍රයෝජනයට ගැනීමට අදාල බලප්‍රදේශයේ පළාත් පාලන ආයතනය පවරා දිය යුතු බව තීරණය කර තිබූ නමුත්, එසේ නොකිරීමෙන් අදාල රංග ශාලාව නිශ්කාර්යව විනාශ වෙමින් පැවතුණි. | -එම- | නවගත්තේගම රංග ශාලාව පිහිට ඉඩම ප්‍රාදේශීය සභාවට පවරා දීමට අදාලව පිඹුර (රේඛා චිත්‍රය) ලබා ගැනීම සඳහා පුත්තලම, ජ්‍යොෂ්ඨ මිනින්දෝරු අධිකාරි කාර්යාලය වෙත මගේ සමාංක 2018.12.04 දින යොමු කළ අතර, ඊට අදාල මැනුම් ගාස්තු නවගත්තේගම ප්‍රාදේශීය සභාව මඟින් 2019.10.22 වන දින රු.11,500.00 මුදලක් අංක 450033 දරණ චෙක්පත මඟින් ජ්‍යොෂ්ඨ මිනින්දෝරු අධිකාරි නමින් ගෙවා ඇත. මේ සම්බන්ධව මගේ සමාංක 2020.03.06 දිනැති ලිපිය මඟින් ජ්‍යොෂ්ඨ මිනින්දෝරු අධිකාරි කාර්යාලය මඟින් විමසීමක් කළ අතර, ඒ සඳහා මැනුම් ඉල්ලීමක් ක්ෂේත්‍රයට යොමු කර ඇති බවත්, මැනුම් කටයුතු නිම කිරීමෙන් පසු |

| | | | |
|---|---|---|---|
| | | | අදාල පිඹුරු පිටපත එවන බවත් ජොෂ්ඨ මිනින්දෝරු අධිකාරි කාර්යාලය මඟින් 2020.06.03 වන දින ලිපියකින් දන්වා ඇත. අදාල පිඹුරු පිටපත ලැබුණු පසු පවරාදීමට අදාල ලේඛන ඉඩම් කොමසාරිස් ජනරාල් වෙත යැවීමට කටයුතු කරන බව කාරුණිකව සඳහන් කරමි. |
| (ඇ) | වෙන්නප්පුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ 2019 ගම්පෙරළිය වැඩසටහන යටතේ ද/උල්හිටියාව පැමිරොනියා මාවතේ සිට ලූෂන් පෙරේරා මාවත දක්වා දිවෙන මාර්ගය තාර අතුරා සංවර්ධනය කිරීමට අදාලව කොන්ත්‍රාත්කරුට රු.770,295ක කලවැඩ වටිනාකමකට අදාලව මුදල් ගෙවා තිබූ නමුත්, වර්ෂා කාලයේ ජලය බැසයාමට මාර්ගය හරහට ඇළක් කපා තිබීම තුළින් උක්ත වැය කල මුදල් නිශ්කාර්ය වියදමක් වී තිබුණි. | මහජන අරමුදල් වැයකර සිදුකරන සංවර්ධන ව්‍යාපෘති වලදී අදාල වගකිව යුතු තාක්ෂණික නිලධාරීන්ගේ අධීක්ෂණය යටතේ ඒවා සිදුවන බවට ආයතන ප්‍රධානීන් සහතික වියයුතු වීම. | ප්‍රාදේශීය සභාවේ අධික වර්ෂාපතනය හේතුවෙන් උල්හිටියාව ප්‍රදේශයේ පුද්ගලික ඉඩම්වල දින ගණනාවක් ජලය රඳා පැවතීම නිසාද ජලය බැස්සවීමට විකල්ප මාර්ගයක් නොතිබූ බැවින්ද ප්‍රාදේශීය සභාවේ කාර්මික නිලධාරීන්ගේ උපදෙස් පරිදි ඉහත මාර්ගය හරහා කාණුවක් කපා ජලය බැස්සවීමට කටයුතු කර ඇති අතර එහි අදාල ප්‍රතිසංස්කරණයන් ප්‍රාදේශීය සභාව මගින් ඉදිරියේදී සිදු කරනු ඇත. |

**3.3 ව්‍යාපෘති නිම නොකර අත්හැර දැමීම**

**---------------------------------------**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | **විගණන නිරීක්ෂණය** | **නිර්දේශය** | **ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම** |
|---|---|---|---|
| | --------------------- | ---------- | ------------------------------ |
| (අ) | මහවැව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ ඉරණවිල සමඟිගම ජල ව්‍යාපෘතිය සඳහා ජල පොම්පාගාරයක් ඉදිකිරීම සඳහා ජාතික ජල සම්පාදන හා ජලාපවාහන මණ්ඩලය මඟින් රු.1,996,170ක ඇස්තමේන්තුවක් ඉදිරිපත් කර තිබූ නමුත්, 2019 වර්ෂයේ සුභිත පුරවර වැඩසටහන යටතේ ඒ සඳහා රු.500,000ක ප්‍රතිපාදන පමණක් වෙන්කර තිබීම නිසා උක්ත ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම අත්හිටුවා තිබුණි. ඇස්තමේන්තු ප්‍රකාරව ප්‍රතිපාදන සපයා ගැනීම පිළිගත් හා විධිමත් ප්‍රසම්පාදන ක්‍රියාපටිපාටිය වුවද, ඒ අනුව ප්‍රමාණවත් ප්‍රතිපාදන වෙන් නොවීම තුළ | ප්‍රාදේශීය සංවර්ධනයට වෙන්කල මුදල්වලින් උපරිම ඵලප්‍රයෝජන ලබාගැනීමට කටයුතු කළ යුතු වීම. | විගණන නිරීක්ෂණ සමඟ එකඟ වෙමි. |

| | | | |
|---|---|---|---|
| | ප්‍රාදේශීය සංවර්ධනයට වෙන්කල මුදල්වලින් උපරිම ප්‍රතිලාභ ලබාගැනීමට නොහැකි වී තිබුණි. | | |
| (ආ) | හලාවත ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ ප්‍රතිලාභීන් 30 දෙනෙකුගේ නිවෙස් වෙත විදුලිය ලබාදීම සඳහා එක් ප්‍රතිලාභියෙකුට රු.20,000 ක් බැගින් ප්‍රතිපාදන වෙන්කර තිබුණි. තවද ගම්පෙරළිය වැඩසටහන යටතේ නිවාස ආධාර ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ දී එක් ප්‍රතිලාභියෙකුට රු.100,000ක් බැගින් ප්‍රතිලාභීන් 46 දෙනෙකු සඳහා 2019 වර්ෂයේ රු.4,600,000 ක ආධාර මුදල් අනුමත වී තිබුණ ද, ප්‍රතිලාභීන් තෝරා ගැනීමේ ක්‍රියාවලියේ තිබූ අඩුපාඩු හේතුවෙන් එකී ආධාර අවශ්‍යම පුද්ගලයන් හඳුනා නොගැනීම නිසා එම ව්‍යාපෘති ක්‍රියාත්මක වී නොතිබුණි. | -එම- | නිවාස ආධාර ලාභී 46 දෙනාම නිවස ඉදිකිරීම 2019.12.31 වන දින වන විට නිම කර ගැනීමට නොහැකි බව පවසා ආධාර මුදල් ලබා ගැනීම ප්‍රතික්ෂේප කර ඇත. මුදල් අමාත්‍යාංශයේ භාණ්ඩාගාර ලේකම් විසින් නිකුත් කරන ලද අංක BD/GPS 155/09/01/HA-2019 හා 2019.11.20 දිනැති ලිපිය මගින් දැනට වැඩ ආරම්භ කර නොමැති සියළුම ව්‍යාපෘති නැවත දන්වන තෙක් අත්හිටුවීම නිසා මෙම ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමට නොහැකි විය. |
| (ඇ) | මුන්දලම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ 2019 අයවැය යෝජනා අනුව 2019 සැප්තැම්බර් 30 දිනට පූර්වයෙන් අනුමත වූ ව්‍යාපෘති 33ක් 2019 වර්ෂයේ ක්‍රියාත්මක කර නොතිබුණි. | ප්‍රාදේශීය සංවර්ධනයට වෙන්කල මුදල්වලින් උපරිම ඵලප්‍රයෝජන ලබාගැනීමට කටයුතු කළ යුතු වීම. | විගණන නිරීක්ෂණ සමඟ එකඟ වෙමි |
| (ඈ) | මාදම්පේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ 557 සී තඹගල්ල බටහිර ග්‍රාම නිලධාරී වසමේ ප්‍රජාමූල සංවිධානයන් මගින් ක්‍රියාත්මක කර තිබූ ජල ව්‍යාපෘතිය සඳහා 2014, 2015 සහ 2017 වර්ෂවල රු.2,674,434ක මුදලක් වැයකර තිබුණි. එසේ වුවද, දෙපාර්ශවයක් අතර ඇති වූ ගැටළුවක් නිසා 2019 වර්ෂය අවසාන වනවිටත්, උක්ත ව්‍යාපෘතියේ වැඩ අවසන් කිරීමට නොහැකි වී තිබුණි. | ව්‍යාපෘති සඳහා රජයේ මුදල් වැය කිරීමේ දී උපරිම ඵලදාවක් ජනතාවට ලැබෙන පරිදි කටයුතු කළයුතු වීම.. | විගණන නිරීක්ෂණ සමඟ එකඟ වෙමි. |

**3.4 ප්‍රසම්පාදනයන්**

-----------------

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| 2019 ගම්පෙරළිය ව්‍යාපෘතිය යටතේ ලැබුණු රු.9,199,686ක් වැයකර කරුවලගස්වැව ප්‍රාදේශීය ලේකම් කාර්යාලය, පුත්තලම - අනුරාධපුර මාර්ගය දෙපස කාණු ඉදිකර කැටගල් අල්ලා තිබුණු අතර, එකම කාරණයට ව්‍යාපෘති 06ක අරමුදල් වැයකර තිබුණි. එය ග්‍රාමීය මාර්ග සංවර්ධන කාර්යයක් නොවන බවත් නගර අලංකාර කටයුත්තක් බවත් නිරීක්ෂණය විය. එසේ ම ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය ප්‍රකාරව අඩුම පිරිවැය යටතේ අදාල කාර්යය ඉටුකර ගැනීමට තිබුණ අවස්ථාව මඟහැර තිබූ බවත්, නිරීක්ෂණය විය. | තාක්ෂණික ඇගයීම් කමිටුවේ නිර්දේශ ලබාගෙන මිලදී ගැනීම් සිදුකල යුතු වීම. | පිළිතුරු ලැබී නොමැත. |

**3.5 වත්කම් කළමනාකරණය**

---------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| (අ) මහකුඹුක්කඩවල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ සංචිත වාහනය ඉතා අබලන් තත්ත්වයේ පවතින අතර, එය නිසි පරිදි අළුත්වැඩියා කර ධාවනය සඳහා කටයුතු කර නොතිබුණි. ආපදා කළමනාකරණ අමාත්‍යාංශයෙන් ලද ට්‍රැක්ටර් රථය හා ජල බවුසරය නිසි පරිදි ප්‍රයෝජනයට නොගැනීමෙන් නිශ්කාර්යව දිරාපත් වෙමින් පැවතුණි. | රජයේ දේපල නිසි අයුරින් ප්‍රයෝජනයට ගතයුතු වීම. | ට්‍රැක්ටර් බවුසර්වල ටැංකි දෙක අව්වට හා වැස්සට නිරාවරණය වන පරිද්දෙන් ගාල් කර ඇත්තේ ඒවා ගාල් කිරීමට ආරක්ෂිත ස්ථානයක් නොමැති බැවිනි. පෙර අවස්ථාවල රථගාල් ඉදිකිරීමට ප්‍රතිපාදන ඉල්ලා සිටිය ද අමාත්‍යාංශය මඟින් ඒ සඳහා තවමත් ප්‍රතිපාදන ලබා දී නොමැති බැවින් නිරාවරණය වන පරිදි ගාල් කර ඇත. |
| (ආ) ආපදා කළමනාකරණ අමාත්‍යාංශය මඟින් මාදම්පේ ප්‍රාදේශීය ලේකම් බලප්‍රදේශයේ නියඟයෙන් පීඩාවටපත් ජනතාවට ජලය සැපයීම සඳහා ලබාදී තිබූ ට්‍රැක්ටර් රථ දෙකක් 2019 ජනවාරි සිට සැප්තැම්බර් | -එම- | -එම- |

| | | | |
|---|---|---|---|
| | මාසය දක්වා කිසිදු ප්‍රයෝජනයක් නොගෙන තිබූ අතර ම, බවුසර් දෙක අනාරක්ෂිතව ප්‍රාදේශීය ලේකම් කාර්යාල පරිශ්‍රයේ ගාල්කර තිබුණි. තවද, උක්ත අමාත්‍යාංශය මඟින් ම ලබාදී තිබූ ලීටර් 1000ක් ජල ටැංකි 30 ක් ද, කිසිදු ප්‍රයෝජනයක් නොගෙන ප්‍රාදේශීය ලේකම් පරිශ්‍රයේ ගොඩගසා තිබුණි. | | |
| (ඇ) | ජාතික ආපදා සහන සේවා මධ්‍යස්ථානය, ස්වදේශ කටයුතු අමාත්‍යාංශය සහ ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය මඟින් නියඟයෙන් පීඩාවට පත් ජනතාවට පානීය ජලය බෙදාහැරීම සඳහා ලබාදෙන ලද ට්‍රැක්ටර්, බවුසර් සහ ලොරි බවුසර් පිළිවෙලින් 25ක්, 09ක් සහ 08ක් ලෙස එකතුව රථ 42ක් ලබාදී තිබූ අතර, එම බවුසර් දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට පවරාගෙන ගිණුම්ගත කිරීමට කටයුතු කර නොතිබුණි. | අදාල වාහන පවරාගෙන ගිණුම් ගතකල යුතු වීම. | පුත්තලම් දිස්ත්‍රික් ලේකම් කාර්යාලය වෙත පවරාගෙන ඇති වාහන සියල්ල 2020 වර්ෂය වන විට ගිණුම්ගත කිරීමට කටයුතු කරන අතර, ආපදා කළමනාකරණ අමාත්‍යාංශය විසින් ලබාදුන් වාහන මෙතෙක් පවරා නොමැති බැවින්, ගිණුම්ගත කල නොහැකි බව දන්වමි. |
| (ඈ) | ප්‍රාදේශීය ලේකම් කාර්යාල පහක වර්ෂ දෙකකට වැඩි කාල පරිච්ඡේදයක් කිසිදු ප්‍රයෝජනයකට ගෙන නොතිබූ රු.5,650,000ක් වටිනාකමැති වාහන 11ක් වෙන්දේසියේ විකිණීමට හෝ කිසිදු ප්‍රයෝජනයකට ගත නොහැකි නම් මුදල් රෙගුලාසි ප්‍රකාරව පොත්වලින් කපා හැරීමට කටයුතු කර නොතිබුණි. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළයුතු වීම. | වසර දෙකකට වැඩි කාලයක් නිෂ්ක්‍රියව පැවති වාහන පවරා ගැනීමේ කටයුතු සඳහා මුදල් අමාත්‍යාංශය වෙත යොමු කර ඇත. |
| (ඉ) | දිස්ත්‍රික් ලේකම් කාර්යාලය සතු වටිනාකම රු.48,200,000ක් වූ නිල නිවාස අටක් වර්ෂ ගණනාවක සිට භාවිතයට නුසුදුසු අබලන් තත්ත්වයේ පැවතුණ ද, එම නිල නිවාස සම්බන්ධයෙන් විධිමත් ක්‍රියාමාර්ග නොගැනීම නිසා ඒවා ක්‍රමිකව විනාශයට භාජනය වෙමින් නිශ්කාර්යව පැවතුණි. | වත්කම් ආරක්ෂාව හා පැවැත්ම සම්බන්ධව වගකිව යුතු වීම. | මෙම ගොඩනැගිලි ප්‍රතිසංස්කරණය කිරීම නිෂ්ඵල කරුණක් වේ. එබැවින් එම ඉඩම් වටා මායිම් වැටක් ඉදිකිරීමෙන් අනතුරුව අදාල ගොඩනැගිලි කඩා ඉවත් කිරීම සුදුසු වන අතර, ප්‍රතිපාදන ලැබීමෙන් අනතුරුව කඩා ඉවත් කිරීමට කටයුතු කරමි. |

## 3.6 පාඩු හා හානි

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| ආණමඩුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ ගම්පෙරළිය කඩිනම් වැඩසටහන යටතේ ග්‍රාමීය මාර්ග බොරළු දමා සංවර්ධනය කිරීමේ දී බොරළු ලබාගැනීම සම්බන්ධයෙන් අධි ඇස්තමේන්තු පිළියෙල කිරීම නිසා අවස්ථා 42 ක දී රු.3,667,149 ක් වැඩිපුර ගෙවා තිබුණි. | නියමිත වැඩ විෂයයට අනුව නිවැරදිව ඉංජිනේරු ඇස්තමේන්තු සකස් කර ගෙවීම් කළයුතු වීම හා නිසි වෘත්තීය සැළකිල්ලකින් තොරව ඉංජිනේරු ඇස්තමේන්තු සකස් කිරීමෙන් සිදුවී ඇති සම්පූර්ණ පාඩුව වගකිව යුතු පාර්ශවයන්ගෙන් ආපසු අයකර ගත යුතු වීම. | මේ සම්බන්ධයෙන් පරීක්ෂා කර වාර්තා කිරීමට මවිසින් පළාත් මාර්ග සංවර්ධන දෙපාර්තමේන්තුවේ විධායක ඉංජිනේරුතුමාගේ සභාපතීත්වයෙන් ත්‍රි පුද්ගල විමර්ශන කමිටුවක් පත්කර ඇත. එම වාර්තාව ලද පසු අවශ්‍ය ක්‍රියාමාර්ග ගන්නා බව. |

## 3.7 රජයේ නිලධාරීන් ඇප තැබීම

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| රජයේ මුදල් හා භාණ්ඩ සම්බන්ධ කටයුතු හා පරිපාලනමය බලය පවරා ඇති හෝ වෙක්පත් අත්සන් කරනු ලබන නිලධාරීන් ස්වකීය රාජකාරී අවංකව ඉටුකරනු ලබන බවට රජයේ ඇප ආඥා පනතේ දක්වා තිබූ පරිදි ඇප තැන්පත් කළයුතු නමුත්, නවගත්තේගම සහ මහකුඹුක්කඩවල ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල නිලධාරී 28 දෙනෙකු ඇප මුදල් තැන්පත් කර නොතිබුණි. | රජයේ නිලධාරීන්ගේ ඇප ආඥා පනතේ 612 අධිකාරිය යටතේ ඇප තැන්පත් කලයුතු වීම. | නිලධාරීන්ට ඇප තබන ලෙස දන්වා අවශ්‍ය කටයුතු සිදු කරමින් සිටින බව. |

### 3.8 අනාර්ථික ගනුදෙනු

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| ගම්පෙරළිය 2019 වැඩසටහන යටතේ නාත්තන්ඩිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ කුම්මෝදර මුස්ලිම් විද්‍යාලයේ ක්‍රීඩාපිටිය සංවර්ධනය කිරීම සඳහා රු.970,000 ක මුදලක් කොන්ත්‍රාත්කරුට ගෙවීමට නියමිතව තිබුණි. එහෙත් මෙම ක්‍රීඩාපිටිය ආසන්නයේ විශාල වශයෙන් ජලය ගලායන ඇලක් පිහිටා ඇති බැවින්, වර්ෂාකාලයේ දී ඇළ පිටාර ගැලීමට හෝ යොදන ලද බොරළු සෝදා යාම වැළැක්විය නොහැකි බැවින්, උක්ත ව්‍යාපෘතිය නිශ්කාර්ය ව්‍යාපෘතියක් බව නිරීක්ෂණය විය. | ව්‍යාපෘති සඳහා රජයේ මුදල් වැය කිරීමේ දී උපරිම ඵලදාවක් ජනතාවට ලැබෙන පරිදි කටයුතු කළයුතු වීම. | ක්‍රීඩා පිටිය කෙළවර පිහිටි ඇළට සමාන්තරව කළුගල් අත්තිවාරමක් දමා ඇත. ඉදිරියේදී ප්‍රතිපාදන සලසා ගෙන එම කළුගල් අත්තිවාරම යම් මට්ටමකට එසවීමට බලාපොරොත්තු වන බැවින් පස් සෝදා යාම මෙමගින් මැඩ පවත්වා ගත හැක . |

### 3.9 කළමනාකරණ දූර්වලතා

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | නවගත්තේගම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ සංචිත වාහනය 2013 මාර්තු 16 දින සිට ආදායම් බලපත්‍ර ලබා ගැනීමෙන් තොරව ධාවනය කරනු ලබයි. | වාහන බලපත්‍ර ලබාගැනීම අනිවාර්ය කටයුත්තක් සේ සළකා කටයුතු කළයුතු වීම. | වාහනය සඳහා නව එංජිමක් තැබීම සිදු කර ඇතත්, ඒ සඳහා වාහනය ලියාපදිංචි සහතිකය සංශෝධනය කර නැති බැවින් දුම් සහතිකය ලබා ගත නොහැකි නිසා ආදායම් බලපත්‍රය ලබා ගත නොහැකිව ඇත. |
| (ආ) | ඉහිණිමිටිය ව්‍යාපාරය යටතේ ඉඩම් පවරා ගැනීම වෙනුවෙන් වන්දි ගෙවීම සඳහා ලැබුණු රු.4,987,137ක් මුදල පොදු තැන්පත් ගිණුමේ වර්ෂ ගණනාවක සිට රඳවාගෙන තිබුණි. එමෙන් ම වන්දි ලාභීන්ගේ ලිපිගොනුවල කටයුතු ද අවසන් තිබුණ ද වන්දි ගෙවීමේ කටයුතු අතපසු කර තිබුණි. | ලිපිගොනුවල කටයුතු නිම වූ පසු මෙම වන්දි මුදල් ගෙවීමට කටයුතු කළයුතු වීම. | මේ සම්බන්ධයෙන් ඉදිරි කටයුතු කිරීම පිළිබඳව ඉඩම් අමාත්‍යාංශය හා නීතිපති දෙපාර්තමේන්තුම වණින් උපදෙස් ඉල්ලා ඇතත්, මේ වන තෙක් ඒ සඳහා උපදෙස් ලැබී නොමැත. උපදෙස් ලද පසු ඉදිරි කටයුතු කරන තෙක් රුපියල් හතලිස් නව ලක්ෂ අසූ හත් දහස් එකසිය තිස් හතක මුදලක් තැන්පත් ගිණුමේ රඳවා ඇති බව කාරුණිකව සඳහන් කරමි. |

| | | | |
|---|---|---|---|
| (ඇ) | රජයේ නිලධාරියෙකු විශ්‍රාම ගොස් නැවත වැටුප් ලබන සේවයකට පැමිණ වැටුප් ලබන අවස්ථාවක එකී වැටුප් සමඟ ගෙවිය යුතු ජීවන වියදම් දීමනාව නැවත නොගෙවිය යුතු බව දක්වා තිබුණ ද, නවගත්තේගම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ විශ්‍රාමික නිලධාරීන් 05 දෙනෙකු සඳහා වැඩිපුර ගෙවා තිබූ රු.242,838ක ජීවන වියදම් දීමනාව සම්පූර්ණයෙන් ම ආපසු අයකරගෙන නොතිබුණි. | වැඩිපුර ගෙවා තිබූ ජීවන වියදම් දීමනාව අයකර ගතයුතු වීම. | ජීවන වියදම් දීමනාව සහිත රජයේ වැටුපක් ලබන විශ්‍රාමිකයන් 05 දෙනෙකු වෙත ජීවන වියදම් දීමනාව ලෙස රු. 741,098.00ක් ගෙවා තිබුණි. එම වරද හඳුනා ගැනීමෙන් පසු එකී නිලධාරින්ගෙන් එම මුදල් අය කර ගැනීමට කටයුතු කල අතර විගණන අවස්ථාව වන විට රු. 242,838 ක් අය කර ගැනීමට තිබූ අතර 2020 අගොස්තු මස වන විට රු. 150,198 ක් අය කර ගැනීමට ඇත. ඒ අනුව වැඩිපුර ගෙවීම් වාරික වශයෙන් විශ්‍රාම වැටුපෙන් අය කර ගැනීමට කටයුතු සිදු කර ඇත. |
| (ඈ) | මහජන අවශ්‍යතා සඳහා රජය වෙත පෞද්ගලික ඉඩම් පවරා ගැනීමේ ක්‍රියාවලිය ප්රාදේශීය ලේකම් විසින් ක්‍රියාත්මක කල යුතු වුවත්, අවස්ථා 04 කදී හලාවත ප්‍රාදේශීය ලේකම් වෙත ඉදිරිපත් වූ ඉඩම් අත්පත් කර ගැනීමේ යෝජනාව ඉදිරිපත් වී වසර 08 – 24 ක් දක්වා කාල පරාසයක් ගතවන තුරු ඉඩම් පවරා නොගැනීම හේතුවෙන් වන්දිවලට අමතරව වන්දි පොලී ද ගෙවීමට සිදුව තිබුණි. | අත්පත් කර ගැනීමේ ක්‍රියාවලිය කඩිනමින් අවසන් කළයුතු වීම. | ඉඩම් අත්පත් කර ගැනීම ආරම්භ කර අවසානය දක්වා සාමාන්‍ය පරිදි සිදු කලද වසර කිහිපයක් ගතවන කාර්යයකි. විවිධ පුද්ගලයින් හා ආයතන රාශියක් සම්බන්ධවන බැවින් ප්‍රමාදයන් වලක්වා ගැනීමට ප්‍රාදේශීය ලේකම්හට පමණක් ක්‍රියා කිරීම අපහසු වේ. කෙසේ වෙතත් අත්පත් කරගැනීම් ක්‍රියාවලියේ දී යම් ප්‍රමාදවීම් සිදු වී ඇති බව පිලිගන්නා අතර අදාල ආයතන සියල්ල සම්බන්ධීකරණය කරගනිමින් මෙම කටයුත්ත කඩිනම් කිරිමට ඉදිරියේ දී කටයුතු කරමි. |
| (ඉ) | දංකොටුව ප්‍රාදේශීය ලේකම් කාර්යාලය මඟින් බොරළු හා මැටි කැපීමේ කටයුතු සඳහා ප්‍රාදේශීය ලේකම් විසින් බලපත්‍ර 03ක් සඳහා නිර්දේශ ලබාදී තිබුණ ද, ඒවාට බලපත්‍ර ලබා දුන්නේ දැයි ප්‍රාදේශීය ලේකම් දැනුවත් කර නොතිබුණි. එබැවින්, භූ විද්‍යා හා පතල් කැනීම් කාර්යාංශය සමඟ අන්‍යෝන්‍ය සම්බන්ධතාවයක් නොමැති වී තිබූ අතර, මේ හේතුවෙන් නීති විරෝධී කටයුතු පාලනය කර ගැනීමට නොහැකි වී තිබුණි. | භූ විද්‍යා හා පතල් කැනීම් කාර්යාංශය මඟින් නිකුත් කරනු ලබන බලපත්‍ර සම්බන්ධව ප්‍රාදේශීය ලේකම් දැනුවත් කිරීමට වැඩපිළිවෙලක් සකස් කළයුතු වීම. | විගණන නිරීක්ෂණ සමඟ එකඟ වෙමි |

| | | | |
|---|---|---|---|
| (ඊ) | මහකුඹුක්කඩවල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට අනුයුක්තව සේවය කල ග්‍රාම නිලධාරී වරයෙකු අල්ලස් ලබා ගැනීම හේතුවෙන් සේවය අත්හිටුවා අධිකරණ ක්‍රියාමාර්ග ගෙන තිබූ නමුත්, ආයතන සංග්‍රහයේ II කාණ්ඩයේ XLVIII පරිච්ඡේදය 27.11 වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තු පරීක්ෂණයක් වෙනම පවත්වා වැරදි හෝ නිවැරදි කර නිශ්චය කලයුතු වුවත්, එසේ සිදුකර නොතිබුණි. | ආයතන සංග්‍රහයේ විධි විධානවලට අනුකූලව කටයුතු කළයුතු වීම. | දෙපාර්තමේන්තු පරීක්ෂණය සිදු කිරීමට අවශ්‍ය කටයුතු ආරම්භ කර ඇත. |
| (උ) | කරුවලගස්වැව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ 609 ඒ පුබුදුගම ග්‍රාම නිලධාරී වසමේ පී.පී.පු.5813 හි කැබැලි අංක 01 හි හෙක්ටයාර් 0.5813ක් නේවාසික කටයුත්තක් සඳහා බදුදී තිබූ අතර, 2019 දෙසැම්බර් 31 දින වනවිට රු.189,730ක් හිඟ බදු මුදලක් ගෙවීමට තිබුණි. බදු මුදල් ගෙවීම පැහැර හැරීම සම්බන්ධයෙන් බදුකරයේ සඳහන් කොන්දේසි අනුව ඉඩමට අදාල බද්ද අවසන් කිරීමට වගකිව යුතු අංශ කටයුතු කර නොතිබුණි. | අදාල බදු ගිවිසුම අනුව කටයුතු කළ යුතු වීම. | පිළිතුරු සපයා නැත. |
| (ඌ) | 1992 අංක 33 දරන පතල් හා ඛනිජ ද්‍රව්‍ය පනත යටතේ පස්, බොරළු සහ වැලි කැපීම සඳහා බලපත්‍ර නිකුත් කිරීමේ බලය භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශය මඟින් සිදුවන අතර, බලපත්‍ර නිකුත් කිරිමට පෙර කරුවලගස්වැව ප්‍රාදේශීය ලේකම් නිර්දේශ කර නොතිබූ අවස්ථාවක විවිධ ආයතනවල අනුමැතිය යටතේ පස් බොරළු සහ වැලි නීති විරෝධීව කැපීම් සිදුකර තිබුණි. | නීති විරෝධීව සිදුවන පස් බොරළු හා වැලි කැනීම් කටයුතු පාලනය සඳහා භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශය මඟින් නිකුත් කරන බලපත්‍ර සම්බන්ධව ප්‍රාදේශීය ලේකම් දැනුවත් කළයුතු වීම. | විගණන නිරීක්ෂණය සමඟ එකඟ වෙමි. |

## 4. තිරසර සංවර්ධන අරමුණු ළගා කර ගැනීම

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් හඳුනාගත් තිරසාර සංවර්ධන අරමුණුවලට අදාල ඉලක්ක සකස් කර නොතිබුණි. | තිරසාර අරමුණුවලට අදාල ඉලක්ක හඳුනාගෙන ඒවා ළඟා කර ගැනීමට කටයුතු කළ යුතු වීම. | පිළිතුරු ලැබී නැත. |
| (ආ) | දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් හඳුනාගෙන ඇති තිරසාර සංවර්ධන අරමුණු හා ඒ අනුව සකස් කළ ඉලක්ක ආයතනයේ ක්‍රියාකාරී සැලැස්මට ඇතුළත් කර නොතිබුණි. | තිරසාර අරමුණු හා ඉලක්ක ආයතනයේ ක්‍රියාකාරී සැලැස්මට ඇතුළත් කළ යුතු වීම. | පිළිතුරු ලැබී නැත. |
| (ඇ) | තිරසාර සංවර්ධන ඉලක්ක කරා ළඟාවීමේදී අදාල කාර්යයන් නියාමනය කිරීම සඳහා අවශ්‍ය සංධිස්ථානයන් හඳුනාගෙන නොතිබුණි. | තිරසාර සංවර්ධන ඉලක්ක කරා ළඟාවීම සඳහා අදාල කාර්යයන් නියාමනය කිරීම සඳහා අවශ්‍ය සංධිස්ථානයක් හඳුනාගත යුතු වීම. | පිළිතුරු ලැබී නැත. |

## 5. යහපාලනය

### 5.1 විගණන හා කළමනාකරණ කමිටුව

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 41 වගන්තියේ දැක්වෙන කර්තව්‍යයන් ඉටුකිරීම සඳහා 2016 ජනවාරි 28 දිනැති අංක **DMA/2009(I)(i)** දරන කළමනාකරණ විගණන චක්‍රලේඛය ප්‍රකාරව කාර්තුවට අවම වශයෙන් එක් රැස්වීම බැඟින් විගණන කළමනාකරණ රැස්වීම් 04 ක් වර්ෂය තුළ පැවැත්විය යුතු විය. එහෙත් කරුවලගස්වැව, මාදම්පේ, මුන්දලම, ආරච්චිකට්ටුව, මහකුඹුක්කඩවල, පුත්තලම, දංකොටුව, වනාතවිල්ලුව සහ නවගත්තේගම ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල රැස්වීම් වාර දෙකක් පමණක් පවත්වා තිබූ අතර, නාත්තන්ඩිය, කල්පිටිය, හලාවත සහ මහවැව ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල රැස්වීම් වාර තුන බැගින් පවත්වා තිබුණි. | 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 41 වගන්තියේ දැක්වෙන කර්තව්‍යයන් ඉටුකිරීම සඳහා 2016 ජනවාරි 28 දිනැති අංක **DMA/2009(I)(i)** දරන කළමනාකරණ විගණන චක්‍රලේඛය ප්‍රකාරව රැස්වීම් පැවැත්විය යුතු වීම. | පිළිතුරු ලැබී නැත. |

## 6. මානව සම්පත් කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ සහ ප්‍රාදේශීය ලේකම් කාර්යාල 16 යෙහි ජ්‍යෙෂ්ඨ මට්ටමේ තනතුරු පුරප්පාඩු **08** ක්, තෘතියික මට්ටමේ පුරප්පාඩු **20** ක්, ද්විතියික මට්ටමේ පුරප්පාඩු **259** ක් සහ ප්‍රාථමික මට්ටමේ පුරප්පාඩු **32** ක් 2019 දෙසැම්බර් 31 දින වනවිටත් පැවතුණි. ජ්‍යෙෂ්ඨ මට්ටමේ පුරප්පාඩු **06** තුළ අතිරේක දිස්ත්‍රික් ලේකම් (ඉඩම්), සහකාර අධ්‍යක්ෂ (සැලසුම්) තනතුරු 04 බැගින් හා සහකාර ප්‍රාදේශීය ලේකම් තනතුරු 03ක්, ගණකාධිකාරී තනතුරු 02 ක් පවතින බව නිරීක්ෂණය විය. එසේ ම දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ හා ප්‍රාදේශීය ලේකම් කාර්යාලයන්හි කාර්මික නිලධාරී අනුමත තනතුරු 34 න් පුරප්පාඩු 22 ක් පැවති අතර, තාක්ෂණ සහායක අනුමත තනතුරු 18න් පුරප්පාඩු 13 ක් පැවතුණි. තොරතුරු සන්නිවේදන තාක්ෂණික සහකාර අනුමත තනතුරු 17 න් 12 ක් ම පුරප්පාඩුව පැවතුණි. ජ්‍යෙෂ්ඨ මට්ටමේ පුරප්පාඩු පැවතීමෙන් මහජන සේවා අඛණ්ඩව හා ඵලදායීව ඉටුකරලීම සඳහා දැඩි බලපෑමක් එල්ල වීම නොවැළැක්විය හැකි හේතුවක් වී තිබුණි. කාර්මික නිලධාරී සහ කාර්මික සහායක පුරප්පාඩු හේතුවෙන් ඉදිකිරීම් ව්‍යාපෘති ඇතුළු සංවර්ධන කටයුතු වල සඵලදායකත්වය හා ගුණාත්මකභාවය පහළ මට්ටමක පැවතීමට හේතුවක් වී තිබුණි. ප්‍රාදේශීය ලේකම් කාර්යාල 16 ට තොරතුරු සන්නිවේදන තාක්ෂණික සහකාර නිලධාරියෙකු බැගින් අනුයුක්තව සිටි අතර, ප්‍රාදේශීය ලේකම් කාර්යාල 04 පමණක් මෙම තනතුර සඳහා නිලධාරීන් අනුයුක්ත කර තිබූ අතර, කාර්යාල 12 ක මෙම නිලධාරීන් පුරප්පාඩුව පැවතුණි. දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ සහ ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල වෙබ් අඩවිය සක්‍රියව පවත්වාගෙන යාම මෙම නිලධාරීන්ගේ රාජකාරිය වූ අතර, පුරප්පාඩු පැවති කාර්යාලවල එම රාජකාරී කටයුත්ත සඳහා පළපුරුදු නොමැති වෙනත් නිලධාරියෙකු යොදවාගෙන තිබුණ ද, එම කටයුත්ත විධිමත්ව ඉටුවී නොතිබුණි. | අත්‍යාවශ්‍ය පුරප්පාඩු තනතුරු සම්පූර්ණ කිරීමට කඩිනමින් කටයුතු කළ යුතු වීම. | කාර්ය මණ්ඩල වාර්තා මඟින් පුරප්පාඩු දන්වා ඇත. |